# කෑ/හත්නාගොඩ කනිටු විදුහල,
# බෙලිගල. (ස.ප.)

මාගේ අංකය KG/G/H.K.V./1

2012.07.10

RECEIVED 17 JUL 2012

ලක්ෂ්මී ආටිගල,
නියෝජ්‍ය විදුහල්පතිනි,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

**<u>ප්‍රශංසා කිරීම.</u>**

*KG/G/H.K.V./1* හා 2012.05.29 දිනැති ලිපියෙන් කෑ/හත්නාගොඩ ක. විද්‍යාලයේ සිසුන්ට පාවහන් ලබා ගැනීම සඳහා ඉල්ලා සිටි ලිපිය හා බැඳේ.

එම ලිපියට අනුව අප විද්‍යාලයේ සිසුන් කෙරෙහි අනුකම්පා කර මානව දයාවෙන් හා කරුණාවෙන් යුතුව ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයක් වූ පාවහන් ලබා දීමට ඔබ තුමියගේ විශේෂ මහන්සිවීම හා උපදෙස් මත *D.S.I.* පාවහන් ලබා දී එම කාර්යය නිම කිරීම පිළිබඳව විදුහල්පති වන මාගේත්, ගුරු මණ්ඩලයේත්, දෙමාපින්ගේත්, දරු දැරියන්ගේත් සහ අසල්වාසීන්ගේත් සතුට දනවන කාරණයක් වූ බව මුලින්ම ප්‍රකාශකර සිටුමු.

මෙම කාර්යය සඳහා ලලිත් ගන්ගේවත්ත මහත්මයා ඇතුළු තවත් මහත්වරු දෙදෙනෙක් සහ රියදුරු මහතා සම්බන්ධ විය. කොළඹ රාජකීය විද්‍යාලය නියෝජනය කරමින් 2012.06.27 වෙනි දින පෙ.ව. 07.45 ට පමණ අප පාසලට පැමිණ ප්‍රධාන ශාලාවේ පැවති පාවහන් බෙදා දීමේ පුංචි උත්සවයට සම්බන්ධ වී එම මහඟු පුණ්‍ය ක්‍රියාව සාර්ථකව නිම කළහ.

මෙහි දී රුපියල් ලක්ෂයක් පමණ වටිනාකමකින් යුත් *D.S.I.* පාවහන් යුගල් 98 ක ප්‍රමාණයක් බෙදා දෙන ලදී. එහි දී ලබාගත් ඡායා රූප කීපයක් මේ සමග එවමි. තවද අප විද්‍යාලයේ සිසුන් කෙරේ අනුකම්පා කර ඔබතුමියගේ හා විද්‍යාලයේ අනුග්‍රහය යටතේ තව තවත් හැකි පමණ උදව් උපකාර කරමින් ඔබ විද්‍යාලයේ පෝෂිත පාසලක් ලෙස සංවර්ධනය කර ගැනීම සඳහා දායක වන ලෙස ද සිහිපත් කර සිටිමි.

2012.06.27 දින පාවහන් බෙදා දෙමින් පාසල් දරුවන්ගේ අධ්‍යාපනය නැංවීමට ඔබතුමිය ගත් උත්සාහය අගය කරන අතර රාජකීය විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමාත්, ඔබතුමිය ඇතුළු සියලුම නියෝජ්‍ය විදුහල්පති මහත්ම මහත්මීන්ටත් අංශ ප්‍රධාන මහත්ම මහත්මීන්ටත් ගුරු මණ්ඩලයටත් පාවහන් බෙදා දීමට පැමිණි ලලිත් ගන්ගේවත්ත මහත්මා ඇතුළු මහත්වරුන්ටත් පාසලේ දරුවන්ටත් මෙම කාර්යය සඳහා දායක වූ සැම දෙනාටත් පුණ්‍යානුමෝදනාවෙන් යුතුව කෘතවේදීත්වය පළකර සිටිමි.

ස්තුතියි.

මෙයට,
හිතවත්,

(විදුහල්පති)